# මහින්ද රාජපක්ෂ විද්‍යාලය - හෝමාගම.

## අවසාන වාර පරීක්ෂණය - 2011

## සිංහල භාෂාව හා සාහිත්‍යය

## 1 පත්‍රය

**6 ශ්‍රේණිය** **කාලය - පැය 02 යි**

MRC IT UNIT

නම/විභාග අංකය :.......................................................................................................................

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

❖ **පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

1) ඇතැම් රටවල ශීත ඍතුව ඇරඹීමත් සමග ම අපේ රටට කුරුල්ලෝ බොහෝ සෙයින් ....................................වෙති.(1. සංක්‍රමණය 2. ආක්‍රමණය 3. සංසරණය.)

2) නොකඩවා ඇද හැලුණු ධාරාණිපාත වර්ෂාව නිසා කඳු මුදුනෙහි තිබූ..................................... පහළට පෙරළුණා හ. ( 1. පර්වත 2. පර්වතයන් 3. පර්වතයෝ )

3. අනතුර සිදුවන විට .................................... එතැනින් ගමන් කරමින් සිටියා ය.

(1. ගුරුවරිය 2. ගුරුතුමා 3. ගුරුවරු)

❖ **නිවැරදි අක්ෂරය තෝරා හිස්තැන් පුරවන්න.**

4. කොට්ඨා.........ය (ශ,ස )

5. ශ්‍රේෂ්......... (ඨ, ට )

6. විශේ............. (ස, ෂ )

❖ **පහත දැක්වෙන නාම පද අතරින් සර්ව නාම පද තෝරා ලියන්න.**

| | | |
|---|---|---|
| අපි | නංගී | ඔහු |
| ශිෂ්‍යයා | මල්ලී | |
| | ඇය | තොපි |
| ගස | පොත | |

7. .....................................................

8. .....................................................

9. .....................................................

10. .....................................................

❖ **සුදුසු වර්තමාන කාල ක්‍රියා පදය තෝරන්න.**

11. ඇය පන්ති කාමරය පිරිසිදු........................................(කරයි/කළා ය )

12. ගොවියෝ කුඹුරු ......................................(කෙටූහ/කොටති )

13. ළමයි සෙල්ලම් ..................................( කරති / කළෝ ය )

❖ **පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.**

14. අන්ධයා ..............................................සැටි කීවා වගෙයි.

15. පරංගියා ......................................ගියා වගෙයි.

❖ **පහත සඳහන් පදවලට ගැළපෙන සමාන පද දෙක බැගින් ලියන්න.**

16. සකි .......................................... ......................................................

17. මිහිකත .......................................... ......................................................

❖ **සුදුසු නිපාත පදය වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

18. ලෝක ළමා දිනය .......................................විවිධ උත්සව සංවිධානය කර තිබුණි. (සඳහා, වෙනුවෙන් )

19. යෝධයින් .............................................මිනිස්සු දුටුගැමුණු රජුගේ හමුදාවේ වූහ. (වැනි, මෙන් )

❖ **පහත සඳහන් වාක්‍ය තුළ ඇති විධි ක්‍රියා පදය තෝරන්න.**

20. පුතා, අද වේලාසිනින් නිවසට පැමිණෙන්න.

MRC IT UNIT

# II පත්‍රය

❖ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

1. ක්‍රියාකාරකමක් ලෙස ඔබ විසින් සකස් කරන ලද තේරවිලි ඇතුළත් පොත් පිංච ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවල ට පිළිතුරු සපයන්න.

I."තේරවිලි" පොත් පිංච සකස් කිරීම සඳහා තොරතුරු ලබාගත් ක්‍රම දෙකක් ලියන්න (ල. 4 )

II. එම තොරතුරු සොයා ගැනීමේදි ඔබ මුහුණ පෑ ගැටලු දෙකක් ලියන්න. (ල. 4)

III. පොත් පිංච සකස් කිරීමේදී ඔබට උදව් කළ අය නම් කරන්න. (ල. 2)

IV. පොත් පිංච සකස් කිරීමේ දි ඔබ ලබාත් නිර්මාණශීලි හැකියා දෙකක් ලියන්න (ල. 4)

V. පොත් පිංච සෑදීමේ දී යොදාගත් අමුද්‍රව්‍ය නම් කරන්න. (ල. 2 )

2. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

I. මට පියාපත් ලැබුණොත්

II. ඉගෙනීමේ අගය

III. ගුරු දෙගුරු ඔබදන් පිළිගනිමු.

IV. මා දුටු පෙරහැරක්

V. මගේ මව්රට ශ්‍රී ලංකාවයි (ල. 20 )

3. ඔබ පාසලේ නව දෙමහල් ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවයට පැමිණෙන ලෙස දන්වමින් දුර පළාතක සිටින මිතුරෙකුට හෝ මිතුරියකට යවන ලිපියක් ලියන්න. (ල. 10)

MRC IT UNIT

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

හිරු දවසේ විරාමය ලබන්නට සූදානම් ය. දවසේ මහා මෙහෙවර අවසන් කර ගෙදර යන්නට සැරසෙන මිනිසුන්, විහඟුන් මෙන් ම හිරු ද ගෙදර යයි. නිකම්ම නොවේ. බටහිර අහස රතු, තැඹිලි, දම් ආදී විවිධ නෙත්කළු වර්ණ මාලාවකින් සරසා සමුගැනීමේ සාදයක් පැවැත්වීමෙන් අනතුරුව ය. ඒ සාදය වෙනුවෙන් හිරු තාමත් අහස සරසයි. ඒ වෙනුවෙන් හිරුට උදව් කරන්නට පැමිණි වලාකුළු බොහෝමයක් තවමත් සුදුපාට ය. නිල්පාට අහස මත මේ වලාකුළු විවිධ සිත්තම් අඳියි. මම බොහෝ වේලාවක් මෙම සොඳුරු සිත්තම දෙස බලා සිටියෙමි.

I. මෙහි කියවෙන්නේ දවසේ කුමන කාලයක් ගැන ද ?

II. හිරුට උදව් කරන්න පැමිණියේ කවුද ?

III. හිරු සමුගැනීමේ සාදය පවත්වන්නේ කෙසේ ද ?

IV. මෙහි සඳහන් උත්තම පුරුෂ සර්ව නාම පදයක් ලියන්න.

V. මෙහි සඳහන් අනුක්ත පදයක් ලියන්න. (ල. 1x 5 = 5 )

5. පහත සඳහන් කවිය සම්පූර්ණ කරන්න.

මහලු වී සිටිය ත්

රුවින් අඩු වී සිටියත්

......................................................

...................................................... (ල 4)

6. පහත සඳහන් පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I. "මේ අපගේ කඳවුරු බැඳ උන් තෙන ය"

අ) මෙම කොටස ඇතුළත් ජාතක කථාවේ නම කුමක් ද ?

ආ) එම ජාතක කථාව ඇතුළත් මුල් කෘතිය කුමක් ද?

ඇ) මෙසේ ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද ?

II. "හෙට අපි හදමු පුතේ තව හොඳ පෝෂ්‍යදායක ආහාරයක් "

අ) මෙසේ ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද ?

ආ) හෙට සෑදීමට යෝජනා කරගත් පෝෂ්‍යදායක ආහාරය කුමක් ද? (ල. 1 x 5 = 5 )

MRC IT UNIT